# නීති විරෝධී ක්‍රියාකාරකම් සඳහා පුද්ගලික ගිණුම් අනිසි ලෙස භාවිතා කිරීම

- ව්‍යාපාරික ගනුදෙනු සඳහා පුද්ගලික බැංකු ගිණුම් භාවිතා කිරීම සාමාන්‍යයෙන් නිර්දේශ නොකෙරේ. එසේ වුවත්, ඇතැම් කුඩා සහ අවිධිමත් ව්‍යාපාර ඔවුන්ගේ පහසුව සඳහා හෝ ව්‍යාපාරික ගනුදෙනු සඳහා වෙනම බැංකු ගිණුම් භාවිතා කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවයක් නොමැතිකම නිසා හෝ ව්‍යාපාරික ගනුදෙනු පුද්ගලික බැංකු ගිණුම් හරහා සිදු කිරීමේ අවදානම පිළිබඳ නොදැනුවත්කම නිසා, ව්‍යාපාරික ගනුදෙනු සඳහා පුද්ගලික බැංකු ගිණුම් භාවිතා කරයි.

- ව්‍යාපාරික ගනුදෙනු සඳහා පුද්ගලික බැංකු ගිණුම් භාවිතා කිරීම වඩා විචක්ෂණ හෝ වෘත්තීයමය ප්‍රවේශය නොවන අතර එය විවිධ අභියෝග සහ අවදානම් වලට තුඩු දිය හැකි ය.

- ඔබ ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම්, ඵලදායී මූල්‍ය කළමනාකරණයක් සහතික කිරීමට ව්‍යාපාරික ගනුදෙනු සඳහා වෙනම බැංකු ගිණුමක් භාවිතා කිරීම නිර්දේශ කරනු ලබයි. එය ගනුදෙනුවල විනිවිදභාවය සඳහා මෙන්ම පුද්ගලික සහ ව්‍යාපාරික අරමුදල් වෙනම පවත්වා ගැනීම සඳහා ද උපකාරී වේ.

- පුද්ගලික සහ ව්‍යාපාරික අරමුදල් එකිනෙක මිශ්‍ර වීම නීතිමය සහ බදු සංකූලතා ඇති කළ හැකි අතර, එය ව්‍යාපාරික මූල්‍ය ඵලදායි ලෙස නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම අභියෝගාත්මක කරයි.

- එසේම, පුද්ගලික සහ ව්‍යාපාරික අරමුදල් එකිනෙක මිශ්‍ර වීම, මුදල් විශුද්ධිකරණය වැනි බරපතල අපරාධයක් යැයි සැක කල හැකි මූල්‍ය විමර්ශනයන්ට හා අපරාධ චෝදනාවන්ට ලක් විය හැක.

- ඒ අනුව නීතිමය සහ නියාමන ගැටළු මඟහරවා ගැනීමට සහ ගනුදෙනුවල විනිවිදභාවය පවත්වා ගැනීමට, ව්‍යාපාරික ගනුදෙනු සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා ගැනීම නිර්දේශ කෙරේ.

- පුද්ගලික සහ ව්‍යාපාරික අරමුදල් වෙන් වෙන් ව පවත්වා ගැනීම, මූල්‍ය කළමනාකරණය පහසු කිරීමට, පුද්ගලික වත්කම් ආරක්ෂා කිරීමට සහ වෘත්තීය විශ්වසනීයත්වය වර්ධනය කිරීමට හේතු වේ.


අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT

0112477125 0112477692 fiu@cbsl.lk www.fiusrilanka.gov.lk